# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013**
**(නව නිර්දේශය)**
**2016 අගෝස්තු - ඔක්තෝබර්**

**සමාජීය විද්‍යා පීඨය**

**මනෝවිද්‍යාව - PSYC - E 3025**

**සෞඛ්‍ය මනෝවිද්‍යාව**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. 'සෞඛ්‍ය' සංකල්පය මනෝවිද්‍යා විෂය රාමුවෙහි වර්ධනය වූ ආකාරය සාකච්ඡා කරමින් සෞඛ්‍ය මනෝවිද්‍යාවේ විෂය අරමුණු විස්තර කරන්න.

02. "ලෝක සෞඛ්‍ය සිතියමෙන් බෝවන රෝග ක්‍රමයෙන් වියැකී යද්දී නව, බෝනොවන රෝග සමුදායක් පැනනගිමින් පවතියි." මෙම සංසිද්ධිය විස්තර කරමින් ඒ කෙරෙහි බලපාන සමාජීය සාධක කවරේදැයි පැහැදිළි කරන්න.

03. මධ්‍යම ස්නායු පද්ධතියේ මූලික ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය විස්තර කරමින් ඒ ආශ්‍රිත ප්‍රධාන රෝග පිළිබඳ විස්තර කරන්න.

04. බෝ නොවන රෝග කළමනාකරණය කිරීමේ ප්‍රධාන මනෝවිද්‍යාත්මක ක්‍රම විමර්ශනය කරන්න.

05. Type - A චර්යා සංකූලතාව යනු කවරේ ද? එය ජය ගැනීමෙහි ලා පුද්ගලයාගේ නිශේධනාත්මක චිත්තවේග පාලනය කෙසේ යොදාගත හැකිදැයි උදාහරණ සමගින් විස්තර කරන්න.

06. ළමාවියේ නිශේධනාත්මක අත්දැකීම් ලැයිස්තුවක් පිළියෙල කරමින් ඒවා පුද්ගලයාගේ පසුකාලීන මානසික අක්‍රමතා කෙරෙහි බලපාන ආකාරය විශ්ලේෂණය කරන්න.

07. පහත විෂය ක්ෂේත්‍ර ආශ්‍රයෙන් විද්‍යුත් සන්නිවේදන උපකරණ (eci) ධූර්ත අක්‍රමතා සංකල්පය විස්තර කරන්න.

- ❖ විද්‍යුත් සන්නිවේදන උපකරණ ධූර්ත අක්‍රමතාවේ ස්වභාවය
- ❖ අක්‍රමතාවයෙහි කායික හා මානසික ලක්ෂණ
- ❖ වින්දිතයන්ගේ (victims) පෞරුෂ ලක්ෂණ

08. පුද්ගලයාගේ මනෝ ප්‍රතිශක්තිය පහත වැටීම ඔහුගේ කායික රෝග වර්ධනය කෙරෙහි හේතුවන ආකාරය සාකච්ඡා කරන්න.

*********************